## රුහුණ විශ්වවිද්‍යාලය

## 2016/2017 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි - 4000 ස්ථලය
## දෙවන සමාසික පරීක්ෂණය - 2018 මැයි

## SLS 42663 – සාහිත්‍යාගත ජනශ්‍රැතිය

**<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>**
**<u>නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකි ය.</u>**

**කාලය : පැය 03 යි.**

---

01. පුරාවෘත්තයක භව්‍ය හා අභව්‍ය සාධක මිශ්‍ර ව පවතින ආකාරය ඔබට අභිමත පුරාතන ගද්‍ය කෘතියක් ඇසුරින් විමර්ශනය කරන්න.

02. සාහිත්‍යාගත ප්‍රස්තාව පිරුළු ආශ්‍රයෙන් මානව චින්තනය හඳුනාගත හැකි ආකාරය විමර්ශනය කරන්න.

03. 'සම්භාව්‍ය ගද්‍ය සාහිත්‍ය පොදු ජන ජීවිතය ආශ්‍රයෙන් උද්භව වූවකි.' ඔබට අභිමත සම්භාව්‍ය ගද්‍ය කෘති ආශ්‍රයෙන් මෙහි සත්‍යාසත්‍යතාව සාකච්ඡා කරන්න.

04. පැරණි ජනයා අතර පැවති ඇදහිලි විශ්වාස සම්භාව්‍ය ගද්‍ය සාහිත්‍යයෙන් ප්‍රකට වන ආකාරය සද්ධර්ම රත්නාවලිය හෝ පන්සිය පනස් ජාතක පොත ආශ්‍රයෙන් සනිදර්ශන ව පැහැදිලි කරන්න.

05. පහත සඳහන් පුරාණෝක්ති අතුරින් තුනක් (03) සම්භාව්‍ය පද්‍ය සාහිත්‍යයේ යෙදී ඇති ආකාරය දක්වා එම පුරාණෝක්තිය පිළිබඳ ව ඔබ දන්නා තොරතුරු විභාග කරන්න.

    i. අගස්ති ඍෂිවරයා
    ii. සරස්වතී
    iii. ගණදෙවි
    iv. උමයංගනා
    v. කුවේර

06. විවාහය නම් සමාජ සංස්ථාව සම්භාව්‍ය පද්‍ය සාහිත්‍යයේ යෙදී ඇත්තේ කවරාකාරයෙන් දැ යි කාව්‍යශේඛරය ආශ්‍රයෙන් පරීක්ෂා කරන්න.

07. භාරතීය සමාජයේ පැවති චාරිත්‍ර වාරිත්‍ර පුරාතන පද්‍ය සාහිත්‍යයෙහි විද්‍යමාන වේ. නිදසුන් දක්වමින් පහදන්න.

08. ඓතිහාසික සත්‍යය, පරිකල්පනය සහ ජනශ්‍රැතිය යන ත්‍රිත්වයෙහි එකමිතියක් ලෙස සාහිත්‍යාගත ජනශ්‍රැතිය අධ්‍යයනය කිරීමට උචිත වන්නේ දැ යි විමසන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 12 බැගිනි)

@@@@@@@@@@@@@